Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : - ගණිතය

සතිය- 3 වාරය 17 සතිය

7 ශ්‍රේණිය

# පුනරීක්ෂණ (01)

(a) සුළු කරන්න.

(i) 15 + 13 + 12 (ii) 18 − 12 + 6 (iii) 9 + 6 − 8

(iv) 8 × 7 − 12 (v) 7 × 3 + 5 (vi) 24 − 18 ÷ 3

(vii) 15 + 18 ÷ 3 (viii) 16 + 5 × 3 (ix) 15 − 9 ÷ 3

(b) 91 − 35 ÷ 7 සුළු කළ විට පිළිතුර 8 බව හසින්ත ප්‍රකාශ කරයි. හසින්තගේ පිළිතුර වැරදි ඇති බවත්, ඔහු සිදු කළ වරද කුමක් ද යන්නත් පැහැදිලි කරන්න.

---

(i) 44හි සාධක ලියන්න.

(ii) 44හි සාධක අතුරින් ප්‍රථමක සාධක වෙන් කර ලියන්න.

(iii) 56 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියා දක්වන්න.

(iv) 18, 30, 42 යන සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

(v) 18, 30, 42 යන සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(i) 522හි ඉලක්කම් දර්ශකය කුමක් ද?

(ii) ඉලක්කම් දර්ශකය ඇසුරෙන් 522, 3න් බෙදෙන බව පැහැදිලි කරන්න.

(iii) ඉලක්කම් දර්ශකය ඇසුරෙන් 522, 9න් බෙදෙන බව පැහැදිලි කරන්න.

(iv) බෙදීමෙන් තොර ව සංඛ්‍යාවක් 4න් බෙදේදැයි පරීක්ෂා කරන්නේ කෙසේද?

(v) [4] [3] [2] [1] යනු කාඩ්පත් හතරක ලියා ඇති ඉලක්කම් හතරකි. මෙම කාඩ්පත් හතර ම යොදා ගනිමින් 4න් ඉතිරි නැති ව බෙදෙන සංඛ්‍යා කීයක් සකස් කළ හැකි ද? ඒවා සියල්ල ලියා දක්වන්න.

(vi) 53☐ යන ඉලක්කම් තුනකින් යුත් සංඛ්‍යාව, 9න් ඉතිරි නැති ව බෙදේ නම් එකස්ථානයේ තිබිය යුතු ඉලක්කම ලියන්න.

(vii) 53☐ යන ඉලක්කම් තුනකින් යුත් සංඛ්‍යාව 6න් ඉතිරි නැති ව බෙදේ නම් එකස්ථානයේ තිබිය යුතු ඉලක්කම ලියන්න.

---

(i)

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 3 | 6 | 19 |
| + | 2 | 8 | 20 |

(ii)

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 16 | 09 | 21 |
| + | 7 | 03 | 9 |

(b) අඩු කරන්න.

(i)

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 6 | 8 | 12 |
| − | 4 | 5 | 20 |

(ii)

| | අවුරුදු | මාස | දින |
|---|---|---|---|
| | 5 | 07 | 19 |
| − | 2 | 09 | 25 |

(10) දරුවකුගේ පස් වන උපන් දිනය 2002 - 08 - 26 දින වේ. එදින ඔහුගේ ස්කන්ධය 20 kg 700 gකි.

(i) ඔහුගේ උපන් දිනය කවරදා ද?

(ii) 8 වන උපන් දිනය වන විට ඔහුගේ ස්කන්ධය 30 kg 600 gක් විය. වසර 3ක් තුළ ඔහුගේ ස්කන්ධය කොපමණ වැඩි වී තිබේ ද?

(iii) 2012 - 03 - 25 දිනට ඔහුගේ වයස සොයන්න.

(iv) 2012 - 03 - 25 දින වන විට 5 වන උපන් දිනයේ දී, තිබූ ස්කන්ධය 12 kg 800 gකින් වැඩි වී තිබේ නම්, එදිනට ඔහුගේ ස්කන්ධය සොයන්න.

---

(i) අගය සොයන්න $6.785 \times 1000$.

(ii) සුළු කරන්න $3\frac{1}{3} - 1\frac{1}{4}$ .

(iii) $a = 4$ වන විට, $2a + 5$ හි අගය සොයන්න.

(iv) 5.075 g, ග්‍රෑම් සහ මිලිග්‍රෑම්වලින් ලියන්න.

(v) විසඳන්න $2x + 5 = 7$.

(vi) 96 cm 6 mm ÷ 7 සුළු කරන්න.

(vii) මෙම ආස්තරයේ වර්ගඵලය සොයන්න.




(viii) පැත්තක දිග 5 cmක් වූ ඝනකයක පරිමාව සොයන්න.

(ix) $1\frac{5}{7}$ විෂම භාගයක් ලෙස ලියන්න.

(x) $\frac{17}{5}$ මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න.

(xi) රූපයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න.




(xii) සමචතුරස්‍රාකාර ඉඩමක පරිමිතිය 22 mක් නම්, ඉඩමෙහි පැත්තක දිග සොයන්න.

(xiii) ඍජුකෝණාස්‍රාකාර ඉඩමක වර්ගඵලය 24 $m^2$ක් ද දිග 8 mක් ද නම්, එම ඉඩමෙහි පළල සොයන්න.

---

(a) පහත දැක්වෙන භාග සහ මිශ්‍ර සංඛ්‍යා දශම සංඛ්‍යා ලෙස ලියන්න.

(i) $\frac{648}{1000}$ (ii) $\frac{6}{20}$ (iii) $\frac{7}{8}$ (iv) $2\frac{1}{4}$

(b) සුළු කරන්න.

(i) $0.875 \times 100$ (ii) $3.25 \times 6$ (iii) $0.005 \times 22$

(iv) $127.5 \div 10$ (v) $24.68 \times 8$ (vi) $13.75 \div 1000$

---

$O$ කේන්ද්‍රය වූ වෘත්තයක් රූපයේ දැක්වේ. $AC$ සරල රේඛාවකි.




(i) $AC$ හඳුන්වන විශේෂ නම කුමක් ද?

(ii) $OB$ මගින් දැක්වෙන දුර හඳුන්වන විශේෂ නම කුමක් ද?

(iii) මෙහි ඇති සමද්විපාද ත්‍රිකෝණ දෙකක් නම් කරන්න.

(iv) $AB = 6$ cm ද $BC = 8$ cm ද වෘත්තයේ අරය 5 cm ද වේ. $OBC$, $AOB$ සහ $ACB$ ත්‍රිකෝණවල පරිමිතිය වෙන වෙනම සොයන්න.